## ලංකා බැංකුව - 2011

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට බැංකුවේ හා එහි පරිපාලිතයන්ගේ මූල්‍ය තත්ත්වය සහ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

<u>අරමුදල් ගිණුම්</u>

(i) අර්ථ සාධක අරමුදල් ගිණුම් හා බැංකුවේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද විස්තරාත්මක උපලේඛන අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| අර්ථ සාධක අරමුදල | අරමුදල් ගිණුම් අනුව | උපලේඛන අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මුළු සාමාජික දායකය | 2,485,120,816 | 2,475,443,452 | 9,677,364 |
| මුළු බැංකු දායකය | 3,730,876,050 | 3,721,336,610 | 9,539,440 |
| සමුච්චිත පොලිය | 12,756,581,521 | 12,797,780,647 | (41,199,126) |
| එකතුව | 18,972,578,387 | 18,994,560,709 | (21,982,322) |

(ii) අර්ථ සාධක අරමුදල හා විශ්‍රාම වැටුප් භාර අරමුදල සඳහා බැංකුවේ දායකය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන හා අරමුදල් ගිණුම් අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| අරමුදලේ නම | මූල්‍ය ප්‍රකාශන අනුව බැංකුවේ දායකය | අරමුදල් ගිණුම් අනුව බැංකුවේ දායකය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අර්ථ සාධක අරමුදල | **523,382,654** | **524,676,577** | **(1,293,923)** |
| විශ්‍රාම භාර අරමුදල | **1,608,447,451** | **1,612,050,672** | **(3,603,221)** |

### 1.2.2 අවිනිශ්චිත ගිණුම්

**දිගු කාලයක සිට ඉදිරියට ගෙන එන ලද පිළිවෙලින් රු.135,078,799 ක් වූ හා රු.2,583,233,504 ක් වූ අවිනිශ්චිත ගිණුම් ණයගැතියන් අයකර ගැනීමට හා ණය හිමියන් පියවීමට කටයුතු කර නොතිබුණි.**

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

**බැංකු ශාඛා විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.**

| | නීති , රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2010 පෙබරවාරි 08 දිනැති අංක 45/2010 දරන කාර්යාල උපදෙස් චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම, සංකේත ක්‍රමය හා වත්කම් පිළිබඳ වාර්ෂික භෞතික සත්‍යාපනය චක්‍රලේඛ උපදෙස් අනුව සිදුකර නොතිබුණි. |
| (ආ) | 1995 සැප්තැම්බර් 05 දිනැති අංක (i). | එකම ශාඛාවේ වර්ෂ 5 කට වැඩි කාලයක් |

| | | |
|---|---|---|
| **29/1995** දරන කාර්යාල උපදෙස් චක්‍රලේඛය | | සේවය කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයන් මාරු කර නොතිබුණි. |
| | **(ii).** | කාර්ය මණ්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකු මාරු කිරීමෙන් තොරව එකම රාජකාරිය අඛණ්ඩව පවරා තිබුණි. |

**2.** මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

**2.1** බැංකුවේ මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ සහ සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන **15,546** ක හා රු.මිලියන **15,851** ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය පිළිවෙලින් රු.මිලියන රු.**10,053** ක් හා රු.මිලියන **11,075** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ පිළිවෙලින් රු.මිලියන **5,493** ක හා රු.මිලියන **4,776** ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. විදේශ විනිමය ලාභය හා ලාභාංශ ආදායම පිළිවෙලින් රු.මිලියන **1,338** කින් හා රු.මිලියන **244** කින් ඉහළයාම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද බැංකුව පෙර වර්ෂයේ සම්බන්ධිත සමාගම්වල කරන ලද ආයෝජනයන්හි වටිනාකම අඩුවීම සඳහා රු.මිලියන **815** ක් වූ ප්‍රතිපාදනයක් ප්‍රතිවර්තනය කර තිබුණි.

කෙසේ වුවද පෙර වර්ෂයේ සුරැකුම්පත් වල ආයෝජනයෙන් රු.මිලියන **3,106** ක ශුද්ධ ලාභයක් පැවතියද කොටස් වෙළඳපොලෙහි පැවති අවාසිදායක තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස සුරැකුම්පත්වල ආයෝජනයෙන් බැංකුවට රු.මිලියන **1,271** ක් වූ විශාල පාඩුවක් දැරීමට සිදුවී තිබුණි.
සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ විවිධ අදියරයන්හි බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2011** | **2010** | **2011** | **2010** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පොලී ආදායම | **60,745** | **50,843** | **63,728** | **53,052** |
| පොලී වියදම | **(36,229)** | **(31,200)** | **(37,384)** | **(32,014)** |

| | | | | |
|---|---|---|---|---|
| ශුද්ධ පොලී ආදායම | **24,516** | **19,643** | **26,345** | **21,038** |
| වෙනත් ආදායම | **10,876** | **12,047** | **10,864** | **13,254** |
| මුළු ආදායම | **35,392** | **31,690** | **37,209** | **34,292** |
| මුළු වියදම | **(19,846)** | **(21,638)** | **(21,357)** | **(23,216)** |
| බදු වලට පෙර ශුද්ධ ලාභය | **15,546** | **10,053** | **15,851** | **11,075** |
| බදු | **(4,025)** | **(3,687)** | **(4,364)** | **(4,162)** |
| බදු වලට පසු ශුද්ධ ලාභය | **11,521** | **6,365** | **11,487** | **6,913** |

**(ආ) විදේශීය බැංකු ශාඛා සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(i) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මාලේ සහ චෙන්නායි ශාඛාවල ලාභය පිළිවෙලින් රු.මිලියන 881.76 ක් හා රු.මිලියන 287.79 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ රු.මිලියන 172.42 ක හා රු.මිලියන 228 ක ලාභය හා සැසඳීමේදී පිළිවෙලින් සියයට 411 ක හා සියයට 26 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.**

**(ii) මාලේ ශාඛාවේ අක්‍රීය ණය අත්තිකාරම් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 96 ක සිට සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 162.57 ක් දක්වා එනම් සියයට 69 කින් වැඩිවී තිබුණු අතර චෙන්නායි ශාඛාවේ අක්‍රීය ණය අත්තිකාරම් ඉකුත් වර්ෂයේ රු.මිලයන 45 සිට සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 32.97 ක් දක්වා එනම් සියයට 27 කින් අඩුවී තිබුණි.**

**2.2** වැදගත් අනුපාතයන්

------------------------

**සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 5 සඳහා වූ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.**

| | ශ්‍රීලංමබැ ප්‍රතිමාන<br>---------- | තථ්‍ය<br>-------- | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | **2006** | **2007** | **2008** | **2009** | **2010** | **2011** |
| | % | % | % | % | % | % | % |
| **(අ)** ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (පෙළ | **5.00** | **11.90** | **11.38** | **11.29** | **11.22** | **10.30** | **8.52** |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1) | | | | | | | |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (පෙළ 2) | 10.00 | 12.30 | 11.40 | 15.88 | 14.16 | 13.73 | 11.64 |
| (ඇ) | ආදායම වර්ධනය | | 28.80 | 42.53 | 19.98 | 5.45 | (0.16) | 12.63 |
| (ඇ) | වත්කම් මත ප්‍රතිලාභ | | 1.19 | 1.11 | 1.13 | 0.82 | 1.60 | 2.01 |
| (ඉ) | ද්‍රවශීලතා අනුපාතය | | 22.19 | 21.20 | 24.21 | 21.13 | 28.65 | 23.36 |

**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **බැංකුව විසින් ප්‍රමාණවත් ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතයක් ( පෙළ 01 ) පවත්වා ගෙන තිබුණද, එය 2006 වර්ෂයේ සිට ක්‍රමක්‍රමයෙන් පිරිහී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සියයට 8.52 දක්වා තවදුරටත් අඩුවී තිබුණි. එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 17.3 ක පහත වැටීමක් විය. මුළු ප්‍රාග්ධන අනුපාතයද සියයට 11.64 ක් දක්වා අඩුවී තිබුණු අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 15.2 ක පහත වැටීමක් විය.**

**(ආ)** **බැංකුවේ ආදායම් වර්ධන අනුපාතය 2008 වර්ෂයේ සිට පැවතුණු උග්‍ර පිරිහීම ඉක්මවමින් , ඉකුත් වර්ෂයේ සෘණාත්මක ආදායම් වර්ධන අනුපාතයට සාපේක්ෂව සියයට 12.6 ක පැහැදිලි වැඩිවීමක් වාර්තා කර තිබුණි.**

**(ඇ)** **සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 2.01 ක් දක්වා වර්ධනය කර ගැනීමට බැංකුව සමත්වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 25.6 ක වැඩිවීමක් විය.**

**(ඇ)** **බැංකුවේ ද්‍රවශීලතා අනුපාතය සියයට 23.36 දක්වා අඩුවී තිබුණු අතර එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 18.5 ක පහත වැටීමක් විය.**

**2.3** **ණය පරිපාලනය**

**-------------------**

උකස් තබන ලද ඇපකර පිළිබඳ මෙන්ම ණය ලැබීමට ගනුදෙනුකරුවන් සතු යෝග්‍යතාවය පිළිබඳ විධිමත් ඇගයීමකින් තොරව ඇතැම් ණය හා අත්තිකාරම් ලබාදී තිබුණ බව විගණන පරීක්ෂණ වලදී හෙළිදරව් විය. ගනුදෙනුකරුවන්ගේ විගණිත ගිණුම් හා සමාගම් පිහිටුවීමට අදාළ නීතිමය ලියකියවිලි කාලීනව ලබාගෙන නොතිබුණි. අත්තිකාරම් සම්බන්ධයෙන් වූ ලිපිගොනු අදාළ ලියකියවිලි හා තොරතුරු සමඟ යාවත්කාලීන කර නොතිබුණි. ඇතැම් අවස්ථාවලදී උකස් දේපල සඳහා රක්ෂණ ඔප්පු ලබාගෙන නොතිබුණි. / යථා පරිදි අළුත් කර නොතිබුණි. උකස් දේපල පිළිබඳව ක්‍රමවත් පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. අවස්ථා කීපයකදී නිරවුල් කිරීම පිළිබඳ ලිපිය අදාළ ණය ගැණුම්කරුවන්ගෙන් ලබාගෙන නොතිබුණි.

මේ සම්බන්ධයෙන් විගණනයේදී පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැව් ප්‍රවාහන නියෝජිත සමාගම

---------------------------------------

2008 වර්ෂයේදී මෙම සමාගමට විදේශීය බැංකු අංශය විසින් පරිපාලක සමාගමේ ආයතනික ඇපකරය හා නැව උකස් කිරීම යටතේ නැවක් මිලදී ගැනීම සඳහා එජඩො මිලියන 1.6 ක ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන හිඟය එජඩො මිලියන 1.1 ක් විය.

කෙසේ වුවද 2009 වර්ෂයේදී සමාගම විකුණා ඇති බැවින් පළමු පරිපාලක සමාගම එහි ආයතනික ඇපකරය අවලංගු කිරීම හේතුවෙන් මෙම පහසුකම සඳහා සුරක්ෂිතතාවයක් නොවූ අතර නව පරිපාලක සමාගමෙන් ආයතනික ඇපකරය ලබාගැනීමට බැංකුවට නොහැකිවී තිබුණි. එසේම මෙම නැව වාණිජමය වශයෙන් නොපවතින අතර සුන්බුන් වටිනාකමක්ද නොමැති විය. කෙසේ වුවද හිඟ මුදල් අයකර ගැනීමට බැංකුව විසින් සමාගමට එරෙහිව නඩුවක් ගොනු කර තිබුණි.

(ආ) චිප්බෝඩ් නිෂ්පාදන සමාගම

---------------------------------

ඊ - ෆ්‍රෙන්ඩ්ස් යෝජනා ක්‍රමය යටතේ රු.මිලියන 50 ක් වූ ණය පහසුකම් පැකේජයක් සහ 2007 වර්ෂයේදී ලී කුඩු යොදා ගෙන චිප්බෝඩ් නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍රෝපකරණ උකසට තබාගෙන රු.මිලියන 1.9 ක වාර ණය මුදලක් මෙම සමාගමට ප්‍රදානය කර තිබුණි. එහි 2011 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රාග්ධන හිඟ මුදල රු.මිලියන 51.8 ක් විය.

**2007 වර්ෂයේ සිට මෙම ණය පහසුකම හිඟව පැවති අතර කාරක ප්‍රාග්ධනය නොමැතිවීම හේතුවෙන් මෙම කර්මාන්ත ශාලාව වසා දමා තිබුණි. උකස් කරන ලද යන්ත්‍රෝපකරණ යථා පරිදි රක්ෂණය කර නොතිබූ අතර 2011 ජූලි මාසයේදී බැංකුව ඒවා රක්ෂණය කර පසුව ගනුදෙනුකරුගෙන් අයකර ගෙන තිබුණි. සමාගම ඇතැම් ගෙවීම් කර තිබුණද, ඒවා අනුමත නිරවුල් කිරීමේ සැලැස්මකට අනුව නොවූ අතර බැංකුව මෙම පහසුකම් යළි උපලේඛනගත කිරීමට සමාගම සමඟ සාකච්ඡා කර නොතිබුණි.**

**මෙම ව්‍යාපෘතිය ඇගයීම් කිරීමේදී අඩුපාඩු තිබූ බව නිරීක්ෂණය වූ අතර සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග මේ වන විටත් ආරම්භකර නොතිබුණි.**

**(ඇ) තේ අපනයන සමාගම**

**මෙම සමාගමට ප්‍රදානය කරන ලද ණය පහසුකම් පැකේජය සඳහා 2007 වර්ෂයේ සිට නොගෙවා පැවති හෙයින් පසුව 2008 වර්ෂයේදී මෙම පහසුකම රු.මිලියන 96.081 ක් සඳහා නැවත උපලේඛනගත කර තිබුණු අතර ගනුදෙනුකරුගේ ඉල්ලීම මත රු.මිලියන 45 ක අතිරේක ණය පහසුකමක්ද බැංකුව ලබාදී තිබුණි. එම නැවත උපලේඛනගත කරන ලද පහසුකම සඳහාද ක්‍රමවත්ව ගෙවීම් කර නොතිබුණි.**
**රු.මිලියන 7.5 ක් සඳහා යළි උපලේඛනගත කරන ලද වාර ණය - ඒ 2 සඳහා උකස් කරන ලද දේපල සඳහා බැංකුව පරාටේ ( Parate ) අයිතිය ක්‍රියාත්මක කර තිබුණු අතර 2010 වර්ෂයේ පවත්වන ලද වෙන්දේසියේදී දේපල බැංකුවට පවරා තිබුණි. කෙසේ වුවද ඉතිරි ණය පහසුකම් අයකර ගැනීම සඳහා බැංකුව අයකිරීම් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට මුළු ණය අනාවරණය රු.මිලියන 99.4 ක් විය.**
**ව්‍යාපාරය පවත්වා ගැනීම සඳහා තවදුරටත් ණය පහසුකම් ලබාදීම බැංකුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සිදුව තිබූ ව්‍යාපාර පාඩු සඳහා රු.මිලියන 15 ක් ඉල්ලමින් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් බැංකුවට එරෙහිව වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි.**

**(ඈ) ලෝහ භාණ්ඩ ව්‍යාපාර හා වතු සැපයුම් සමාගම**

ඉහත සමාගමට එකතුව රු.133,148,219 ක් වූ ණයපහසුකම් නුවරඑළිය අධිශ්‍රේණී ශාඛාව විසින් ප්‍රදානය කර තිබුණු අතර එම ණය 2009 වර්ෂයේ සිට අක්‍රීය ණය අත්තිකාරම් ලෙස පැවතුණි.

ලංකා බැංකු ආඥාපනතේ 21 වගන්තිය යටතේ 2010 දෙසැම්බර් මාසයේදී බැංකුව වෙන්දේසි දැන්වීම ප්‍රසිද්ධකර තිබුණද, ණයගැණුම්කරුගේ ඉල්ලීමට අනුව 2011 ජුනි දක්වා කාලය දීර්ඝකිරීම ලබාදී තිබුණු අතර ගනුදෙනුකරු රු.1,015,000 ක මුදලක් තැන්පත්කිරීම හේතුවෙන් 22 වගන්තිය යටතේ ප්‍රසිද්ධකිරීම සඳහා යවන ලද දැන්වීම අවලංගු කරන ලදි. පසුව 2011 අගෝස්තු සිට වර්ෂයක් සඳහා මාසිකව රු.500,000 තැන්පත් කිරීම සඳහාවූ ගිවිසුම අනුව අවසාන ප්‍රතිලාභයක් ලෙස උපචිත පොලියෙන් සියයට 50 ක් අත්හැරදැමීමට බැංකුව එකඟවී තිබුණි.

කෙසේ වුවද රු.මිලියන 3.5 ක තැන්පතුවෙන් නැවත උපලේඛනගත කළ "බී" පහසුකම සම්පූර්ණයෙන් අයකරගෙන තිබූ අතර 2012 වර්ෂයේ වෙනත් ණය මුදලකින් රු.487,344 ක්ද අයකර තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට වෙනත් ණය පහසුකම්වලින් ලැබිය යුතු මුළු ප්‍රාග්ධන හිඟ මුදල රු.133,058,953 ක් විය. පහසුකම් නැවත උපලේඛනගතකිරීම සඳහා සාකච්ඡා ප්‍රගතියේ පවතී.

(ඉ) නැව් ප්‍රවාහන හා සම්බන්ධිත සේවා සැපයීම් සමාගම

විදේශ මුදල් බැංකු ඒකකය ( FCBU ) විසින් මෙම සමාගම සඳහා ණය පහසුකම් ප්‍රදානය කර තිබුණු අතර ණය අවසන් කිරීමේ ප්‍රතිලාභයක් ලෙස එජඩො 65,000 ක පොලී සහනයක් සමඟ එජඩො 814,062 ක් සඳහා 2005 වර්ෂයේදී එය යළි උපලේඛන ගතකර තිබුණි. තවද මෙම සමාගමට ණය පහසුකම් සම්පූර්ණයෙන් නිරවුල් කිරීම සඳහා රු.මිලියන 1.08 ක් වූ අයිරා පහසුකම මත සියයට 50 ක පොලිය අත්හැරදැමීමට සහ එහි එක් සහෝදර සමාගමක් සඳහා රු.මිලියන 14.8 ක් වූ සියයට 70 ක පොලිය අත්හැරදැමීමට අනුමත කර තිබුණි.

සමාගම තවදුරටත් අක්‍රීය තත්ත්වයේ පවතින බැවින් විදේශ හා දේශීය මෙහෙයුම් නවත්වා ඇති අතර තවදුරටත් නව ලිපිලේඛන සමඟ උපලේඛනගත කිරීමට නොහැකිවී ඇත. එබැවින් 2012 ජනවාරි 31 දිනට වන උපචිත පොලියෙන් (එජඩො 122,215) සියයට 40 ක් අත්හැර දැමීම සහිතව 2012 පෙබරවාරි 01 සිට අවසාන ගෙවීම් දිනය තෙක් උපචිත වන පොලිය සමඟ සියළු ගෙවියයුතු දැ ආපසු ගෙවීම මත පවත්නා අවසාන ප්‍රතිලාභය වූ එජඩො 65,000 සමඟ පහසුකම මාස 120 කින් ගෙවා නිමකිරීමට වූ මුල් අධ්‍යක්ෂවරුන්ගේ ආපසු ගෙවීමේ සැලැස්ම 2012 පෙබරවාරි 24

දින අනුමතකර තිබුණි. කෙසේ වුවද සමාගම **2012** සැප්තැම්බර් දක්වා මාසිකව එජඩො **8,133.02** ක් ගෙවා තිබුණු අතර ඉන්පසු එයට අනුකූලවී නොතිබුණි. තවද බැංකුව එන්තර වාසියක් යැවීම සඳහා නීති දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කර තිබුණි. **2011** දෙසැම්බර් **31** දිනට මුළු ප්‍රාග්ධන හිඟය එජඩො **792,640** ක් විය.

**(ඊ)** ඇගලුම් නිෂ්පාදන සමාගම

මෙම සමාගම ආයෝජන මණ්ඩලයට අයත් සමාගමක් වු අතර බැංකුව විසින් මහා බ්‍රිතාන්‍ය පවුම් **(GBP) 1,500,000** ක් හා එජඩො **350,000** ක භාර ලැබීම් ඇතුළත් ණය පහසුකම් පැකේජයක් විදේශ මුදල් බැංකු ඒකකය **(FCBU)** මඟින් **2006** වර්ෂයේදී ප්‍රදානය කර තිබුණි. බැංකුවෙන් ලබාගත් ණය පහසුකම් පැහැර හරින ලද වෙනත් සමාගමක් මෙම සමාගම විසින් අත්කර ගෙන එම පැහැරහැරි සමාගමේ අක්‍රීය ණය නිරවුල් කිරීමට එකඟවී තිබුණද, මෙම සමාගම විසින් ස්වකීය පහසුකම් පැහැරහැර තිබුණි.

මේ අතරතුර පුද්ගලික බැංකුවක් වෙතින් ලබාගත් පහසුකම්ද සමාගම විසින් පැහැර හැර ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර පුද්ගලික බැංකුව විසින් එහි සියළු වත්කම් භාරයට ගෙන තිබීම හේතුවෙන් එහි සියළු මෙහෙයුම් අවසන් කර ඇත.

**2010** වර්ෂයේ සාකච්ඡා අනුව, තාවකාලික අයිරාවෙන් හා උපචිත පොලියේ සියයට **75** ක (එජඩො **25,524**) අත් හැරීම සමඟ උකස් කිරීම් පහසුකමේ ප්‍රාග්ධන හිඟයෙන් කොටසක් හා ඉන් පසු **2011** ඔක්තෝබර් **24** සිට උපචිත වන පොලිය සමඟ හිඟ ප්‍රාග්ධන මුදලින් බැංකුව අයකර ගන්නාලද එජඩො **150,000** ක් තැන්පත්කර තිබුණි. තවද නීතිමය කටයුතු ආරම්භ කිරීම සඳහා ලිපිලේඛන නීති දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි.
අත්කරගත් සමාගමෙන් ලැබිය යුතු සියළු දෑ නිරවුල්කර ණයවල, භාර ලැබීම්වල හා තාවකාලික අයිරාවල මුළු ප්‍රාග්ධන හිඟය **2011** දෙසැම්බර් **31** දිනට පිළිවෙලින් මහා බ්‍රිතාන්‍ය පවුම් **1,387,955** , එජඩො **170,000** සහ රු.**12,478** ක් විය.

**(උ)** අධ්‍යාපන සේවා සැපයුම් සමාගම

**2006** හා **2007** වර්ෂවලදී රු.මිලියන **294** ක වාර ණය මුදල් තුනක් මෙම සමාගමට ප්‍රදානය කර තිබුණු නමුත් ක්‍රමවත්ව ගෙවා නොතිබුණු හෙයින් **2007** වර්ෂයේ සිට හිඟ හිට පැවතුණි. ණය පහසුකම් යළි උපලේඛනගත කිරීම සඳහා ගනුදෙනුකරු

සමඟ පැවති සාකච්ඡා සාර්ථක නොවූ අතර උකස් කරන ලද දේපල සඳහා පරාටේ **(Parate)** අයිතිය ක්‍රියාත්මක කිරීමට බැංකුව කිහිපවරක් ගත් උත්සාහයන්, ගෙවීම් කිහිපයක් කිරීමෙන් පසු ගනුදෙනුකරුගේ ඉල්ලීම මත අත්හිටුවා තිබුණි.

කෙසේ වුවද සැලකිය යුතු කාලපරිච්ඡේදයක් ලබාදී තිබුණද, පිළිගතහැකි ආපසු ගෙවීම් සැලැස්මක් ඉදිරිපත් කිරීමට සමාගමට නොහැකිවී තිබූ අතර **2011** දෙසැම්බර් **31** දිනට මුළු ණය අනාවරණය රු.මිලියන **274.3** ක් විය. කෙසේ වුවද **2012** වර්ෂය තුළදී ආපසු ගෙවීම් ලෙස ගනුදෙනුකරු රු.මිලියන **19.8** ක මුදලක් ගෙවා තිබුණි.

## 2.4 අක්‍රීය අත්තිකාරම් ( NPA ) සහ බොල් ණය සඳහා ප්‍රතිපාදන

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක සඳහා අක්‍රීය ණයවලට අදාළ තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

| වර්ෂය | මුළු බිල්පත්‍ර ණය සහ අත්තිකාරම් | අක්‍රීය ණය අත්තිකාරම් | මුළු බිල්පත්‍ර , ණය සහ අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස අක්‍රීය ණය අත්තිකාරම් | බොල් ණය සඳහා ප්‍රතිපාදන | බොල් ණය සඳහා ප්‍රතිපාදන මුළු අක්‍රීය ණය අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | % | රු.මිලියන | % |
| **2009** | **275,061** | **15,542** | **5.60** | **9,956** | **64** |
| **2010** | **382,310** | **12,639** | **3.31** | **9,588** | **76** |
| **2011** | **552,792** | **11,416** | **2.07** | **9,140** | **80** |

(ආ) (i) සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් ශාඛාවල අක්‍රීය ණය අත්තිකාරම්ද ඉහළ ප්‍රතිශතයක් නිරූපණය කර තිබුණි.

| ශාඛා සංකේතාංකය | ශාඛාවේ නම | මුළු අත්තිකාරම් | මුළු අක්‍රීය ණය අත්තිකාරම් | අක්‍රීය ණය අත්තිකාරම් මුළු අත්තිකාරම්වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | % |
| 7 | පානදුර | 1,996 | 275 | 13.8 |
| 49 | නුගේගොඩ | 2,737 | 216 | 7.9 |
| 618 | මෙට්‍රාපොලිටන් | 5,469 | 394 | 7.2 |
| 122 | ගලෙන්බිඳුණු වැව | 545 | 36 | 6.5 |

**ii.** ගනුදෙනුකරුවන් **10** දෙනෙකුගේ අක්‍රීය ණය අත්තිකාරම් එකතුව රු.**1,557,318,298** ක් වූ ඉහළ අගයන් නිරූපණය කර තිබුණි.

**(ඇ)** ගනුදෙනුකරුවන් **10** දෙනෙකුට අදාළව ප්‍රාග්ධනය හා පොලිය ලෙස පිළිවෙලින් රු.**9,688,763** ක් හා රු.**31,494,089** ක් ලියාහැර තිබුණි.

## 2.5 තහනම් කළ දේපල

අත්තිකාරම් ලබාදීම සඳහා බැංකුවට උකසට තබන ලද දේපල කිහිපයක්, හිඟ ණය අත්තිකාරම් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කර තිබුණි. රු.මිලියන **899** ක් වූ ඇපයට තබන ලද දේපල **110** ක් **2011** දෙසැම්බර් **31** දක්වා විකුණා නොතිබුණි. එම දේපල පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| **2011** දෙසැම්බර් **31** දිනට නොවිකුණන ලද දේශීය දේපල ( සටහන් **01** ) | **440,778,551** |
| **2011** දෙසැම්බර් **31** දිනට නොවිකුණන ලද විදේශීය දේපල ( සටහන් **02** ) | **457,978,267** |
| **2011** දෙසැම්බර් **31** දිනට නොවිකුණන ලද දේපල වල එකතුව | **898,756,818** |

සටහන් **01**

| විස්තරය | දේපල සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|

| | | |
|---|---|---|
| | | රු. |
| **විසඳා අවසන් කිරීමට ඇති දේපල** | **15** | **128,882,881** |
| **ආකූලත්වයන් පැවතුණු ( උසාවි නඩුව හා වෙනත් විසඳීමට ඇති කරුණු )** | **73** | **232,664,510** |
| **විකිණීම සඳහා ප්‍රසිද්ධ කිරීමට උපලේඛනගත කළ දේපල** | **17** | **70,930,758** |
| **සම්පූර්ණ ලිපි ලේඛන කට්ටලය නොලැබුණු දේපල** | **02** | **8,300,402** |
| **2011 දෙසැම්බර් 31 දිනට වටිනාකම** | **107** | **440,778,551** |

**සටහන් 02**

| | දේපල සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| | | එ.ජ.ඩො. |
| **මුළු වටිනාකම** | **03** | **4,020,527** |
| **වටිනාකම එජඩො 4,020,527.32 රු.113.905 බැගින්** | | **රු.457,958,164** |

**ආකූලත්වයන් සහිත දේපල 73 කින් ( උසාවි නඩුව හා වෙනත් විසඳීමට ඇති කරුණු පවතින ) දේපල 54 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් ඉකුත් වූ ඒවා බව නිරීක්ෂණය විය.**

**2.6 සී බැන්ක් කාඩ් මධ්‍යස්ථානය**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) 2011 දෙසැම්බර් 31 දිනට කාඩ් 113,717 ක් කාඩ් මධ්‍යස්ථානය විසින් නිකුත් කර තිබුණු අතර එම දිනට මුළු හිඟ ශේෂය රු.1,954,662,380 ක් විය. මෙයින් රු.74,047,340 ක් එනම් සියයට 3.8 ක් අක්‍රීය ලෙස වර්ග කර තිබුණි. මුළු අක්‍රීය ණය අත්තිකාරම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.**

| වර්ගය | රු. |
|---|---|

| | |
|---|---|
| **කල් ඉක්මුණු** | **5,067,135** |
| **උප ප්‍රාමාණික ( Substandard )** | **8,046,490** |
| **සැක සහිත** | **5,136,282** |
| **පාඩුව** | **55,797,433** |
| **එකතුව** | **74,047,340** |

**(ආ)** **කාඩ් ලබාගත් දින සිට 2011 දෙසැම්බර් 31 දක්වා කිසිදු වාරිකයක් නොගෙවූ කාඩ් අයිතිකරුවන් සංඛ්‍යාව 59 ක් වූ අතර මුළු හිඟ ශේෂය රු.3,419,230 ක් විය.**

**(ඇ)** **2007 සිට 2011 කාලපරිච්ඡේදය තුළ කාඩ් මධ්‍යස්ථානයේ පහසුකම් 1766 ක් සම්බන්ධයෙන් ලියාහරින ලද ප්‍රාග්ධනය හා පොලිය පිළිවෙලින් රු.57,841,951 ක් හා රු.45,932,433 ක් විය.**

**2.7** **බැංකුවට එරෙහිව ගොනු කර ඇති නඩු**

**2011 දෙසැම්බර් 31 දක්වා සාමාන්‍ය බැංකු මෙහෙයුම් සම්බන්ධයෙන් වූ ආරවුල් සඳහා බැංකුවට එරෙහිව ගොනුකර ඇති උසාවි නඩු 135 ක් මගින් රු.මිලියන 753 ක ( දළ වශයෙන් ) වන්දි ඉල්ලා තිබුණි.**

**2.8** **කල් බදු**

**කල් බදු ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත දැක්වෙන ශාඛා ඉහළ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතයන් වාර්තා කර තිබුණි.**

| **ශාඛාවේ නම** | **අක්‍රීය ණය අත්තිකාරම් ප්‍රමාණය** | **අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය** |
|---|---|---|
| | **රු.** | **%** |
| **රත්මලාන** | **23,368,823** | **74.64** |
| **වලස්මුල්ල** | **8,799,287** | **62.94** |

| | | |
|---|---|---|
| කෑගල්ල | **4,682,448** | **58.35** |
| කරමැටිය | **2,062,164** | **39.94** |
| අගුණකොළපැලැස්ස | **3,324,828** | **39.05** |
| දෙහිවල | **6,254,677** | **38.74** |
| තංගල්ල | **8,867,248** | **37.39** |
| පස්වෙනි නගර | **5,436,222** | **33.10** |
| කොළොන්නාව | **12,201,963** | **25.26** |
| වීරකැටිය | **18,992,470** | **24.76** |

**2.9 උකස් කිරීම්**

**--------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **ශාඛා 6 ක් සම්බන්ධයෙන් වටිනාකම රු.මිලියන 7.383 ක් වූ ව්‍යාජ උකස් භාණ්ඩ හා බලය නොලත් උකස් භාණ්ඩ පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය විය.**

**(ආ)** **අවිනිශ්චිත ණයහිමි ගිණුමේ පැවති මාස 6 කට වැඩි අතිරේක මුදල් හිමිකම් නොපෑ ශේෂ ගිණුමට මාරුකර නොතිබුණි.**

**2.10 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **බදු දේපල**

**------------**

**(i)** **බැංකුවේ ව්‍යාප්ත කාර්යාල ඇතුළත් ශාඛා 400 ක් බදුකර පරිශ්‍රවල ස්ථානගතව තිබුණි. එම කාර්යාල වලට අදාල බදු ගිවිසුම් 23 ක් 2011 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී තිබුණු අතර 2012 වර්ෂයේ මැයි මාසය අවසාන වන විටත් එම ගිවිසුම් අළුත් කිරීමෙන් තොරව පැවතුණි. එම ගිවිසුම් අළුත් කිරීමෙන් තොරව ශාඛා කටයුතු එම ස්ථානවලම පවත්වා ගෙන යමින් තිබුණි.**

**(ii)** **ගිනි හා සොරකම් අවදානම පිළිබඳ රක්ෂණ ආවරණයක් නොමැතිව බදු පරිශ්‍ර 197 ක ව්‍යාපාර බැංකුව සිදුකරමින් තිබුණු බව නිරීක්ෂණය විය.**

**(ආ)** **බදු ගෙවීම**

**-----------**

**එකතු කළ අගය මත බද්දෙන් අඩුකළ හැකි 2011 දෙසැම්බර් 31 දිනට ශාඛා 14 ක බදු ගිණුම් පිළිබඳ රු.1,675,359 ක් වූ යෙදවුම් බද්ද සඳහා හිමිකම්පෑමට අදාල ශාඛාවලින් මුල් ඉන්වොයිසි ප්‍රධාන කාර්යාලයට නොඑවීම හේතුවෙන් හිමිකම්පෑමට නොහැකිවී තිබුණි.**

**2.11** **ආයෝජන**

**------------**

**(i)** **සම්බන්ධිත සමාගම්වල ආයෝජන**

**---------------------------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **සීමාසහිත සී බැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික ) සමාගම**

**-------------------------------------------------------------------**

**මෙම සමාගමෙහි හිමිකාරත්වය මුළුමනින්ම බැංකුව සතුවන අතර, සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ විශේෂයෙන්ම සේවක ශුභසාධනය උදෙසා වන්දනා / නිවාඩු නිකේතන / අමුත්තන්ගේ නිවාස පවත්වාගෙනයාමයි. සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ සමස්ත සේවක සංඛ්‍යාව 135 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(i)** **කළමනාකරණ ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් බැංකුව විසින් පිළිවෙලින් රු.මිලියන 7.748 ක් හා රු.මිලියන 7.457 ක් ලබාදී තිබුණි.**

**(ii)** **2011 වර්ෂය තුළදී මහනුවර හා යාපනය පිහිටි නිවාඩු නිකේතන පිළිවෙලින් රු.මිලියන 0.341 ක් හා රු.මිලියන 0.037 ක පාඩු ලබමින් පවත්වාගෙන ගොස් තිබුණි.**

**(ආ) මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී සමාගම**

**-----------------------------------------------------**

**සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ කල්බදු හා කුලීපිට ගැණුම්, වෙළඳ පහසුකම් මුල්‍යයන , ආයතනික උපදේශක සේවා, අරමුදල් කළමනාකරණය , ප්‍රාග්ධන වෙළඳපොළ කටයුතු , ආයතනික ලේකම්සේවා සහ නීති සේවාවන්ය. සමාගමේ සියයට 72.14 ක ප්‍රාග්ධනයක් බැංකුව සතුව පැවතුණි. සමාගමේ සමස්ත කාර්ය මණ්ඩලය 202 ක් විය.**

**මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා සේවිංස් බැංකුව මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී සමාගමේ පරිපාලිතයන්ගෙන් එකක් වන අතර ඒ අනුව එය ලංකා බැංකුවේ ඍජු නොවන පරිපාලිතයක් ලෙස නිර්වචනය කළ හැක. තවද එම්බීඑස්එල් සේවිංස් බැංකුව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රීලංමබැ) නිකුත් කරන නියෝග වලට එය අනුකූල විය යුතුය.**

**කෙසේ වුවද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලාත්මක කරන ලද අනිවාර්ය අවශ්‍යතාවයන් එම්බීඑස්එල් සේවිංස් බැංකුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(i)** **බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා සෑම අවස්ථාවකදීම බරතැබූ වත්කම් මුළු අවදානම සම්බන්ධයෙන් සියයට 10 කට නොඅඩු ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතයක් පවත්වා ගැනීම මහා බැංකුවේ අවශ්‍යතාවය වේ. 2011 වර්ෂයේ පළමු කාර්තු තුනෙහි මෙම අනුපාතය පවත්වා ගැනීමට බැංකුව සමත්වී තිබූ අතර 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සතරවන කාර්තුව සඳහා මෙම අනුපාතය සියයට 7.76 ක් දක්වා අඩුවී තිබුණි.**

**(ii)** **ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද නියෝගවලට අනුව , බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් එහි මාසික මුළු තැන්පතු**

වගකීමෙන් සියයට 20 ක අවම මාසික සාමාන්‍ය ද්‍රවශීලතා වත්කම් අනුපාතයක් පවත්වාගත යුතුය. කෙසේ වුවද 2011 වර්ෂයේදී බැංකුවේ මාසික මුළු තැන්පතු වගකීම මත එහි ද්‍රවශීලතා වත්කම් අනුපාතය සියයට 16 දක්වා අඩුවී තිබුණි.

**(ඇ) සීමාසහිත එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් සමාගම**

---------------------------------------------------

සමාගමේ ප්‍රධාන කාර්යයන් වුයෙන් සියළුම වර්ගවල සාමාන්‍ය රක්ෂණය හා ජීවිත රක්ෂණ ප්‍රාරක්ෂණය කිරීමයි. එම්බීඑස්එල් රක්ෂණ සමාගමෙහි බැංකුවේ අයිතිය සියයට 56.28 ක්වූ අතර එය මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී සමාගමේ පරිපාලිතයක්ද වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 3.905 ක බදු පසු ලාභයක් ලබාගැනීමට සමාගමට හැකිවී තිබුණි.

(ii) මෙම ලාභය, සමාගමේ 2010 වර්ෂයේදී රු.මිලියන 390.002 ක්වූ ( පුන ප්‍රකාශයෙන් පසුව ) සමුච්චිත අලාභය 2011 වර්ෂය තුළදී රු.මිලියන 386.097 ක් දක්වා අඩුකිරීමට හේතුවී තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හා රක්ෂණ ව්‍යාපාරයේ නුබුන්වත් අනුපාතය පිළිවෙලින් සියයට 1.56 ක් හා සියයට 5.04 ක් විය.

**(ඇ) සීමාසහිත බීඕසී ට්‍රැවල්ස් ( පුද්ගලික ) සමාගම**

---------------------------------------------------

මෙම සමාගමෙහි හිමිකාරත්වය සම්පූර්ණයෙන්ම බැංකුව සතුවන අතර එහි ප්‍රධාන කාර්යය වුයේ චාරිකා ආශ්‍රිත සේවාවල යෙදීමයි. 2011 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු වත්කම් වටිනාකම රු.මිලියන 137.318 ක් විය.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාගමේ විගණකවරුන් විසින්, සමාගමේ සේවකයන්ගේ ප්‍රතිලාභ ගණනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකිරීම මඟින්

තත්ත්වාගණනය කිරීමෙන් තොරව , සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ප්‍රකාශ කර තිබුණි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ( 2006 සංශෝධනය කරන ලද ) අනුව, පසු - සේවා නියුක්ත ප්‍රතිලාභ බැදීම්, සුදුසු ආයුගණක ක්‍රමය හෝ පාරිතෝෂික සූත්‍ර ක්‍රමය යොදා ගැනීම මගින් ගණනය කළ යුතුය. එහෙත් සමාගම 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ මාස 1/2 ක වැටුප සේවා කාලයේ වර්ෂ ගණනින් ගුණ කිරීම මගින් පසු-සේවා නියුක්ත ප්‍රතිලාභ බැදීම ගණනය කර තිබුණි. තවද මෙය සමූහ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමඟ පරස්පර විරෝධී බව නිරික්ෂණය විය.

(ඉ) සීමාසහිත බීඕසී ප්‍රොපටි ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් ( පුද්ගලික ) සමාගම

---

මෙම සමාගමේ ප්‍රධාන කාර්යය වනුයේ , කොළඹ 03 පිහිටි බීඕසී මර්චන්ට් ටවර් සහ මහනුවර පිහිටි සී බැන්ක් හවුස් නැමති සමාගම සතු ගොඩනැඟිලි දෙකෙහි කාර්යාල ඉඩකඩ කුලියට දීමයි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) සමාගම සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 90.526 ක් හා 2010 වර්ෂයේ රු.මිලියන 32.633 ක ලාභයක් උපයා තිබුණි.

(ii) 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අලාභය රු.මිලියන 6.240 ක්ව පැවතුණි.

(ඊ) සීමාසහිත බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පුද්ගලික) සමාගම

---

මෙම සමාගමේ ප්‍රධාන කාර්ය භාරය , බැංකුවේ මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා සේවකයන් බඳවාගැනීම වන අතර ඒ සඳහා කොමිස් මුදලක් බැංකුවෙන් අයකරනු ලබයි. මෙම සමාගම සම්පූර්ණයෙන්ම බැංකුවට අයත් පරිපාලිතයකි.

සමාගම සමාලෝචිත වර්ෂය තුළ එහි ප්‍රධාන අරමුණු ක්‍රියාත්මක කර නොතිබුණු අතර ආයෝජන කටයුතුවලින් පමණක් ආදායම උපයා තිබුණි.

**(ii)** වෙළඳ හුවමාරු නොවන කොටස්වල ආයෝජනය

පහත දැක්වෙන වෙළඳ හුවමාරු නොවන කොටස්වල ආයෝජනයෙන් 2010 වර්ෂය තුළ ලාභාංශ ලැබී නොතිබුණි.

| සමාගම | කොටස් සංඛ්‍යාව | ආයෝජන වටිනාකම |
|---|---|---|
| | | රු |
| සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් | 12,115,571 | 3,250,450,000 |
| සීමාසහිත කැන්ඩි ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රීස් | 191,790 | 1,918,000 |
| සීමාසහිත මැග්පෙක් එක්ස්පෝර්ට්ස් | 300,000 | 4,355,000 |
| සීමාසහිත සෙරන්ඩිබ් කොකනට් ප්‍රඩක්ට්ස් | 37,500 | 375,000 |

**(iii)** ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමාගමේ ආයෝජන

බැංකුව 2009 වර්ෂය තුළදී එමිරේට්ස් එයාර්ලයින් සමාගමට අයත් ශ්‍රීලන්කන් එයාර්ලයින් කොටස් වලින් සියයට 43.63 ක් මිලට ගෙන තිබුණි. සාධාරණ කාලපරිච්ඡේදයක් තුළදී ආපසු පැවරීමට යටත්ව ශ්‍රී ලන්කන් එයාර්ලයින් කොටස් මිලදී ගැනීම සඳහා මුදල් මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි.

2010 මාර්තු 31 දිනට හා 2011 මාර්තු 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය පිළිවෙලින් රු.මිලියන 2,716 ක් හා රු.මිලියන 3,098 ක් විය. ආයෝජනය කළ දින සිට කිසිදු ආදායමක් බැංකුව උපයා නොතිබුණි.

අළුත් තක්සේරුවක් කිරීමෙන් පසු සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමාගමේ කොටස්වල රු.බිලියන 3.25 ක් ආයෝජනය කිරීම සඳහා බැංකුව රු.බිලියන 1.788 ක මුදලක් 2012 වර්ෂයේදී ලබාදුන් බව බැංකුවේ සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

**3.** පද්ධති හා පාලන

**-------------------**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බැංකුවේ සභාපති වෙත වරින්වර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තා මඟින් බැංකුවේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.**

**(අ)** ණය පරිපාලනය

**(ආ)** මානව සම්පත් කළමනාකරණය

**(ඇ)** ශාඛා කටයුතු

**(ඈ)** ඉන්වෙන්ට්‍රි

**(ඉ)** තැන්පතු

**(ඊ)** ගනුදෙනුකරු සේවා

**(උ)** ගිණුම්කරණය

**(ඌ)** රක්ෂණය

**(එ)** ප්‍රසම්පාදන

**(ඒ)** බදු ගෙවීම

**(ඔ)** ආයෝජන

**(ඕ)** නඩු කීම

**(ක)** ගිණුම් වාර්තා පවත්වා ගැනීම

**(ග)** තාවකාලික අයිරා පහසුකම්